**ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය - 2025**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම්වල වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂයන් හී වෙනස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ දැක්විය යුතු වුවත් 2025 වර්ෂය අවසානයට ගෙවිය යුතු ශේෂයන් හී වැඩිවීම වූ රු.178,217 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ගැළපීමට කටයුතු කර නොතිබුණි. තවද ගැලපීම් තුළ ඇතුළත් කර තිබූ විගණන ගාස්තු වෙන්කිරීම් රු.75,000 ක් වැඩියෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ලද පොලී ආදායම රු.121,196 ක් වැඩියෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයට අදාළව වෙන් කළ රු.75,000 ක් වූ විගණන ගාස්තුව ඌන වෙන්කිරීමක් වීම නිසා 2025 වර්ෂයේ එය ගලපා ඇත. ඒ අනුව වෙනස 110,800 ක් වී ඇත. අප විසින් කරන ලද ගණනය කිරීම් පදනම්ව පොලී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත. කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ශුද්ධ වෙනස ඇතුළත් කර ඇති නිසා ගෙවිය යුතු ශේෂ වෙනස නිරූපණය වේ. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය වෙත පරිත්‍යාගයක් ලෙස 2025 අගෝස්තු 26 වන දින ලැබී තිබූ මුද්‍රණ යන්ත්‍රයේ සාධාරණ අගය තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාගයක් ලෙස ලද මෙම වත්කම වෙළඳපොළ වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීමට කටයුතු කරනු ලැබේ. | පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම්වල සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලෙජර් ගිණුම්වලට අනුව සහ ශේෂ පිරික්සුමට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අතැති මුදල් (සුළු මුදල්) සහ ගමන් වියදම් ශේෂයන් පිළිවෙලින් රු.23,987 ක් හා රු.97,728 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂයන් පිළිවෙලින් රු.38,987 ක් හා රු.93,254 ක් ලෙස දක්වා තිබුණි. ශේෂ පිරික්සුමේ දැක්වෙන රු.17,500 ක පාඨමාලා ගාස්තු වියදම මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුලත්ව නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් ශේෂය රු.15,000 ක් වැඩියෙන් ද වර්ෂයේ වියදම රු.21,974ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | 2026 වර්ෂයේදී සුළු මුදල් සහ ගමන් වියදම් නිවැරදිව ගිණුම්ගත කරනු ලැබේ. | ගනුදෙනු නිවැරදිව ලෙජර් ගිණුම්වල සටහන් කර ලෙජර් ගිණුම්වල ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ පොලී ආදායම රු.958,392 ක් ලෙසද, ලැබිය යුතු පොලී ආදායම රු.420,164 ක් ලෙස ද ගිණුම්ගත කර තිබුණු නමුත් විගණනයේ ගණනය කිරීම් අනුව වර්ෂයේ පොලී ආදායම රු.999,154 ක් ද ලැබිය යුතු පොලී ආදායම රු.386,949 ක් ද විය. ඒ අනුව වර්ෂයේ ලාභය රු.40,762 කින් අවප්‍රමාණය වී තිබුණු අතර ජංගම වත්කම් රු.33,215 කින් අධිප්‍රමාණය වී තිබුණි. | ස්ථාවර තැන්පතු කල්පිරීමේ දින ගණන මත පදනම්ව ගණනය කිරීම්වල වෙනසක් ඇත. මෙය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ශේෂ පිරික්සුම සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනුව සාමාජික ගාස්තු ආදායම රු.3,440,395ක් වුවද එය ආදායම් ප්‍රකාශයේ රු.3,431,395 ක් ලෙස රු.9,000ක් අඩුවෙන් දක්වා තිබීමෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | සියලුම ආදායම් මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව ඇතුළත් කර ඇති අතර රු.9000 ක් ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. | සියළුම ගිණුම් ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉකුත් වර්ෂයේ ආදායම් බදු ප්‍රතිපාදන වූ රු.218,794 ක මුදල ප්‍රමාණවත් නොවීම නිසා එය රු.349,620 කින් එනම් රු.568,414 ක් දක්වා වැඩි කර තිබූ අතර එම ගැලපීම රඳවාගත් ලාභයට ගැලපීම වෙනුවට ප්‍රවර්ථන වර්ෂයේ බදු වියදමට ගලපා තිබීමෙන් ප්‍රවර්ථන වර්ෂයේ බදු වියදම රු.349,620 කින් අධි ප්‍රමාණයවී තිබූ අතර රඳවාගත් ඉපයීම් ශේෂය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | 2024 බදු ආදායම් වෙන් කිරීම ප්‍රමාණවත් නොවූ නිසා ඌණ වෙන් කිරීම් ලෙස හඳුනාගත් බදු ආදායම ගලපා ඇත. නිවැරදි කිරීමට එකඟ වෙමි. | මූල්‍ය වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,710,467 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,819,003ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,108,536 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පරිහීමට වර්ෂයේ මුළු ආදායම රු.8,373,416 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිතත්ත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනයෙහි කාර්යාල පරිශ්‍රය 2006 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරියට අයත් වර්ග අඩි 144 ක භූමි ප්‍රමාණයක් තුළ පවත්වාගෙන යන අතර ඊට අදාළ නිත්‍යානුකූල එකඟතාවයක් දෙපාර්ශවය විසින් මේ වන තෙක් ඇති කර ගෙන නොතිබුණි. | මෙය තවමත් සාකච්ඡා මට්ටමේ පවතින අතර අවසන් එකඟතාවයකට පැමිණ නොමැත. | කාර්යාලය පවත්වාගැනීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අරමුණු සහ සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිතත්ත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර වෘත්තියේ ගෞරවය හා පිළිගැනීම ආරක්ෂා කරමින් හා ඉහළ නංවමින්, අධ්‍යාපනය, පර්යේෂණ සහ විද්‍යාත්මක දැනුම භාවිතය තුළින් පරිසර කළමනාකරණයේ උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාමට දායක වීම යන ප්‍රධාන අරමුණ ඉටුකරගැනීම සඳහා ආයතනයේ ප්‍රධාන කාර්යභාරයන් ඉටු කර ගැනීම සඳහා | අදහස් දක්වා නොමැත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර පනතේ සඳහන් අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් වෘත්තීය සුදුසුකම් සහිත නව සාමාජිකයින් 137 දෙනෙකුට සාමාජිකත්වය ලබාදීම, නිලධාරීන් 102 දෙනෙකු සඳහා වෘත්තීය සංවර්ධන හා පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම, පර්යේෂණ ප්‍රකාශන 03 ක් මුද්‍රණය කර ප්‍රකාශයට පත්කිරීම සහ අම්බුලුවාව ජෛව විවිධත්ව තක්සේරුවට අදාළව පර්යේෂණ කිරීම සහ ලේඛනගත කිරීමට සහයවීම යන කාර්යයන් සිදුකර තිබුණි.